


'දුවන්න විසිරෝ - දුවන්න''

විසිරා අඳුරේම ප්‍රෙක්ෂකාගාරයට වැදිලා සෙනග අතරේ සැඟවුණා. පොලිස් රාලහාමි තවමත් විසිරා පස්සේ. ......

"දුවන්න විසිරෝ දුවන්න"

වේදිකාවේ ළමා ගායන වෘන්දය ඉහළින්ම ගායනා කරනවා. තිරය වැසී යන්වා.

පන්හිඳ මේ ලියන්න පටන් ගත්තේ ළමා නාට්‍යයක තිර රචනාවක්. ඒත් ඒ පන්ගේ තිර රචනයක් නෙවි. මෙල්බන් නුවර අපි අතරේ ඉන් ප්‍රවීණ වේදිකා රංගන වේදියෙක් අධ්‍යක්ෂකවරයෙක්, තිර රචකයෙන් වෙන කුසුම්සිරි ලියනාරච්චි මහත්තයාගේ තිර රචනයක්. ඒ වගේම මේ පටන් ගැන්මකුත් නෙවි. ''විසිරා'' ළමා වේදිකා නාට්‍යයේ තවත් එක මහජන දැක්මක අවසානයක්.

"ළමුන්ගේ ගායනා තවම හිතේ දෝංකාර දෙනවා."

පන්හිඳ තමන්ට දැණුන දේ ලිය්න ගත්තා. ප්‍රවීණ රංගනවේදිනී යශෝධරා සරච්චන්ද්‍ර ශිල්පිනියගේ ගායන තාල රටාවලට දූ දරුවන් කරන ගායනා සරළයි. ඒ වගේ ම හිතට කාවදිනවා. මේ විදිහේ සුසංයෝගහයක් ඇතිවෙන්නේ කොහොමද ? තිර පිටපත ලියනකොටම මේ රිද්ම රටා දෙබස්වලටයි ගායන වලටයි කුසුම්සිරි ලියනාරච්චි ශිල්පියා ඇතුළත් කරනවද ?"

ප්‍රදර්ශනය අග ආචාර සමාචාර සුබ පැතුම් අතරින් පන්හිඳ ලියනාරච්චි මහත්තයගෙන් අහපු එකම ප්‍රශ්ණයයි ඒ.

මම දිගටම තිර රචනය ගලාගෙන යන විදියට ලියනවා. යශෝදරා තමයි මාත් එක්ක එකතු වෙලා තාල හදන්නේ. තනු නිර්මාණය කරගන්නේ දෙන්නගෙම එකඟත්වයෙන්. කුසුම්සිරි මහත්තයා උත්තර බැන්දා පන්ට. ඉතින් පන් ලියනවා මෙහෙම.

සැබෑ ජීවිතයේදී එකතු වෙලා යුග දිවි මග ගෙවන්නට පෑහුණා වගේම මේ දෙපළගේ නිර්මාණත් අපූරුවට පෑහිලා. ඒ නිර්මාණ වල පළ විඳින්නේ කවුද ? අපි අපේම දරුවෝ. ඒ කොහොමද ? කුසුම්සිරි යශෝදරා දෙපළ අපේ දරුවන්ගේ ආචාර්යවරු දෙපළක් වෙලා. මේ කණ්ඩායම තමයි 1ශ්‍රී ලංකන් තියටර් ගෲප් - මෙල්බන්." "විසිරා" මේ කණ්ඩායමේ මුල්ම ඉදිරිපත් කිරීම නෙවි.

ඒත් විසිරා වෙනත් අතකින් මෙල්බන් නුවර අපේ අය ලබන අළුත් අත්දැකීමක් බවට පත් වෙනවා. එක එක මති මතාන්තර හන්දා බිඳිදා බෙදිලා යන අයට හොඳ පූර්වාදර්ශයක් දෙන්නත් එක්ක විසිරා නිෂ්පාදනය කරන්න මේ කණ්ඩායමත් එක්ක අත්වැල් බැඳගන්නෙ තවත් ළමා කණ්ඩායමක්. ඒ මෙල්බන් මුතුහර ළමා සමාජයයි. මෙල්බන් මුතුහර කණ්ඩායම ලෝකයේ දෙවන අන්තර්ජාතික මුතුහර සමාජයයි. කණ්ඩායමේ අංකය 2514. මේ කණ්ඩායමට උපදෙස් දෙමින් මෙහෙයවන්නේ වත්සලා ඉෂ්ඨවීර මහත්මිය.

මුලින්ම විසිරා නාට්‍ය පුහුණු කරවන්නයි අපේ ආචාර්යවරු දෙපළ මුතුහර ළමා සමාජයට උදව් දෙන්නෙ. ඒත් සරු නිර්මාණයක් ජනගත කරන්න ඕන කරන දක්ෂයෝ ශ්‍රී ලංකන් තියටර් ගෲප් එකෙත් ඉන්න නිසා ඒ අයවත් දායක කරගත්තලු මේ නිර්මාණයට. මොනවා වුණත් මේක ලේසි වැඩක් වුණේ නෑ. දෙගොල්ලන්ටම. දෙගොල්ලන්ගෙම එක ළමා කණ්ඩායමක් නගරයෙන් නැගෙනහිර අන්තයේ; අනික් කණ්ඩායම බටහිර අන්තයේ. මේ අය පාසල් ඇරිලා ඒ ඒ ප්‍රදේශවල පුහුණුවීම්වලට ගිහින් ගෙදර ඇවිත් තියෙන්නෙ එළිවෙන යාමෙට. ඉගෙන ගන්න දේවල් ගෙදර වැඩ වගේම විභාගත් අනික් ළමයින්ට වගේම මේ අයටත් තිබුණා. ළමයින්ගේ වගේම දෙමව්පියන්ගේ උනන්දුව කැපවීම ගැන වෙනමම ලියන් ඕන නෑ. අන්තිමට වේදිකාවෙන් ඒ හැම දෙයක්ම දැක ගන්න ලැබුණා.



මේ දරුවෝ දහම් පාසැල්වල සිංහල භාෂා පාසල්වල විවිධ ප්‍රසංගවල වගේ ම වෙන ප්‍රසංගවලත් කුඩා කාලයේ ඉඳන්ම ගැවසුණ ගැවසෙන පිරිසක්. ඒ නිසා ඒ අයගේ හැකියාවල් ඔපමට්ටම් වෙලා දියුණු වෙලා ඉදිරියට යන ආකාරය දැක 'කම කාට වුණත් ඇති වෙන්නේ ලොකු සතුටක්. ඒවා හැමදාමත් දියුණුවෙන් දියුණුවටම පත් වෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා.

දරුවන්ගේ හැකියාවල් හොඳට අඳුනගෙන ඒ ඒ අයට ගැලපෙන චරිත පවරලා දෙන්න කුසුම්සිරි - යශෝධරා ආචාර්ය දෙපබ දක්වලා තියෙන්නේ අපූරු හැකියාවක්. කුඩා ම දරුවගේ පවා රඟපෑමේ විතරක් නෙවි; ගායනය, හඬ විහිදුවීම, උච්චාරණය නර්තනය අභිනය වාගේ දේවල් ඉස්මතු වෙන් පුහුණු කරවලා තිබුණ අපූරුව දැක්කම ඇස්වලට කඳුළු උනනවා. මේ අය හැමෝවම සම්බන්ධ කරගෙන මේ වාගේ ළමයින්ගේ වැඩක් වේදිකාවට ගෙනෙන එක වෙනම අභ්‍යාසයක්. ළමයින්ව විනයක් ඇතිව හසුරුවාගෙන ආරක්ෂා කිරීම මේ කටයුතු කරන්න වත්සලා ඉෂ්ඨවීර මහත්මියත් දරන්න ඇත්තේ කියන්න බැරි තරමේ වෙහෙසක්. දෙමව්පියොත් ඒ වෙහෙසට බෙදා හදාගන්න උර දෙන්න ඇත.

''විසිරා'' අතීතයේ කරපු කටිකමක් පසසෙන් පොලිස් රාළහාමි තවම පන්නනවා. විසිරා ඉන් පස්සෙ යහපත් දේට යොමු වුණත් රාළහාමිට ඒකෙ වගක් නැති ගානයි. රාළහාමිට විසිරා "විසිරා" මයි. කාකි කොට කලිසමකින් සැරසීගත් රාළහාමි කෙනෙක් වගේ යල් පැන ගිය නීතිය අතීත වරදකරුවා හඹා යද්දී අනේකවත් වර්තමාන වරදකරුවන් තමන්ගේ රැහැණින් මග හැරෙනවා. කලියුගයේ නව පන්නයේ වරදකරුවන් නීතියේ රැහැනින් බේරෙද්දි විසිරාට තවමත් නීතිය හමුවේ පළා යන්නට වෙලා; සැඟවෙන්නට වෙලා. කලියුගයේ සමාජයට වින කරන්නන් එක්ක බලනකොට විසිරා අහිංසකයෙක්. නීතියට මේ බව නොදැනුනාට පොදු මහත් ජනතාවට ඒ බව අපූරුවට දැනෙනවා. ඔවුනට කරන්න පුළුවන් එක ම දේ විසිරාට පළා යන්නට සැඟවෙන්නට තමන්ගේ හිතට එකඟව අනුබල දෙන එක විතරයි. ඉතින් ඒකයි ඒ අය හිතින්ම ගයන්නේ;

**"දුවන්න විසිරෝ - දුවන්න.......!"**

